**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන - 2014**

**-----------------------------------------------**

නිපුණතා ආංශික සංවර්ධන වැඩ සටහනේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි අංක 5516 එල් කේ හා අංක 5517 එල්කේ දරන මූල්‍ය ගිවිසුම්වල II ආ 3 වගන්තියේ 2 උපලේඛනයේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**------------------------------------------------------------------------------**

වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, එවකට යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර එවකට යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ආයතන 09 ක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, 2020 වන විට දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා කාර්යක්ෂම අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම සහ වෘත්තීය පුහුණු හා ආධාරක ප්‍රතිපත්ති, පද්ධති හා ව්‍යුහයන් සඳහා ගුණාත්මක බව, අදාළත්වය, ප්‍රවේශය හා හඳුනාගැනීම වැඩි දියුණු කිරීම වැඩ සටහනේ අරමුණු වේ. වැඩ සටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 125,916 කට සමාන එජඩො මිලියන 961 ක් වන අතර ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් රු.මිලියන 13,100 කට සමාන එජඩො මිලියන 100 ක් සැපයීමට එකඟ වී තිබුණි. තවද රු.මිලියන 18,523 කට සමාන එජඩො මිලියන 141 ක් ආසියානු සංවර්ධන බැංකුව, ජර්මන් රජය හා කොරියන් අපනයන ආනයන බැංකුව විසින් සැපයීමට අපේක්ෂා කර තිබුණි. එවකට යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා වෙනත් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන 09 ක් විසින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ අඩංගු වේ. වැඩසටහන් කාර්යයන් 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2020 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------------**

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩ සටහනේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩ සටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහනේ කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩ සටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන 09 සඳහා දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩ සටහනේ ප්‍රගතිය, වැඩ සටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, වෘත්තීය පුහුණු අංශයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට වැඩ සටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2.5 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද පරිගණක හා උපාංග පිටපත් කිරීමේ දෝෂයක් හේතුවෙන් වාහන යටතේ වර්ගීකරණය කර දක්වා තිබුණි.

(ආ) රු.මිලියන 24.65 ක පිරිවැයකට නිපුණතා ආංශික සංවර්ධන අංශය සඳහා සිදුකරන ලද ගොඩනැගිලි නවීකරණ වැඩ සහ උපකරණ ප්‍රසම්පාදනය රේඛීය අමාත්‍යාංශයේ වියදමක් ලෙස දක්වනු වෙනුවට වැඩසටහනේ වියදමක් ලෙස අයකර තිබුණි.

(ඇ) රු.මිලියන 53.03 ක වැටුප් හා වෙනත් මෙහෙයුම් පිරිවැය සහ රු.මිලියන 4.6 ක ප්‍රචාරණ පිරිවැය සේවක පුහුණු පිරිවැය ලෙස දක්වා තිබුණි.

### 2.2.2 නොසැසඳු ශේෂ

ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන 09 කින් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන 06 ක එක් එක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් විෂයයන් කිහිපයක සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය වී තිබුණද එම වෙනස්කම් සසඳා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.
විස්තර පහත දැක්වේ.

| ආයතනය | සමාලෝචිත වර්ෂය සඳහා වියදම | |
|---|---|---|
| | ඉදිරිපත් කරන ලද එක් එක් මූල්‍ය ප්‍රකාශන අනුව | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව |
| | රු.මිලියන | රු.මිලියන |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 1,830.61 | 1,668.11 |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය | 1,061.37 | 994.75 |
| වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය | 248.02 | 313.11 |
| ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය | 299.03 | 347.57 |
| ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය | 172.06 | 191.22 |
| තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 99.81 | 94.25 |

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

ප්‍රදාන නියෝජිතායතන සමඟ එකඟ වූ පරිදි ව්‍යාපෘතිය සම්බන්ධිත දර්ශක කිහිපයක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන වෙනුවෙන් රු.මිලියන 2,585 ක මුදලක් වෙන්කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 1,648 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, අයවැය සභාය ලෙස මහා භාණ්ඩාගාරයට ව්‍යාපෘතිය සඳහා සැලසුම් කරන ලද අරමුදල් හා 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ තථ්‍ය මුදල පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල |  | 2014 දෙසැම්බර් 31 දක්වා |  | 2014 දෙසැම්බර් 31 දක්වා මුදාහරින ලද අරමුදල් |  |
|---|---|---|---|---|---|---|
|  | ණය ගිවිසුම අනුව |  |  |  |  |  |
|  | එජඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 100.0 | 13,100 | 40.0 | 5,240 | 20.04 | 2,613 |
| ජා සං ස (IDA) | 100.0 | 13,100 | 9.6 | 1,205 | - | - |
| ජර්මන් රජය | 15.4 | 2,017 | - | - | - | - |
| කොරියන් අපනයන- ආනයන බැංකුව | 26.0 | 3,406 | - | - | - | - |
| ශ්‍රී ලංකා රජය | 719.8 | 94,293 | - | - | - | 7,308 |
| එකතුව | 961.2 | 125,916 | 49.6 | 6,445 | 20.04 | 9,921 |

ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 41 ඡේදය අනුව, සමාලෝචිත වර්ෂය තුළ ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් එජඩො මිලියන 9.6 ක් ලැබීමට නියමිත වී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් කිසිදු අරමුදලක් මුදාහැර නොතිබුණි. ණය නියෝජිතායතනය සමඟ ණය ගිවිසුම අත්සන් කර තිබුණේ 2014 සැප්තැම්බර් 12 දින බව නිරීක්ෂණය විය.

## 3.2 භෞතික ප්‍රගතිය

වැඩසටහනේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන විසින් සමාලෝචිත වර්ෂය තුළ උප වැඩසටහන් 59 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 3,457.52 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ උප වැඩසටහන් 44 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 1,657.53 ක මුදලක් පමණක් වැය කර තිබුණි. තවද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සිදුකිරීම සඳහා සැලසුම් කරන ලද උප වැඩසටහන් 11 කින් උප වැඩසටහන් 05 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් සිදු කිරීමට සැලසුම් කරන ලද උප වැඩසටහන් 08 කින් වැඩසටහන් 05 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

## 3.3 මූල්‍ය පාලන පිළිබඳ කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 24 ඡේදය අනුව, වැඩසටහන යටතේ සියලු ආයතනවල අභ්‍යන්තර විගණන අංශ විසින් අවදානම් පදනම් ඉහළ බලපෑම් හේතු සහිත විගණනයන් සිදු කිරීමට අවශ්‍යවන අතර වැඩසටහනේ නිපුණතා ආංශික සංවර්ධන අංශය විසින් නියාමන කාර්යයන් සඳහා පියවර ගැනීම අවශ්‍ය වේ. රේඛීය අමාත්‍යාංශය සහ වෙනත් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන විසින් අභ්‍යන්තර විගණන අංශ ස්ථාපිත කර විගණකවරුන් 55 දෙනෙකු එයට අනුයුක්ත කර තිබුණද ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන 05 ක් යටතේ ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පිළිබඳ අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබුණි. තවද අනෙකුත් නියෝජිතායතන විසින් ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවල ප්‍රමාණාත්මක සොයා ගැනීම් නොතිබුණි.

(ආ) වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවල කාර්ය මණ්ඩලය සඳහා හඳුන්වාදෙන ලද දිරි දීමනා යෝජනා ක්‍රම, අපේක්ෂිත ප්‍රතිඵල මත හා රේඛීය අමාත්‍යාංශය විසින් සංවර්ධනය කරන ලද නිර්නායකයන් පදනම් කරගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා දිරි දීමනා සඳහා දරන ලද මුළු පිරිවැය රු.මිලියන 97.09 ක් විය.